## නාම පද

යම්කිසි දෙයක්, කෙනෙක්, ස්ථානයක්, සතෙක් හඳුන්වන පද නාමපද ලෙසින් හැඳින්වේ.

නාම පද වර්ග 4 කි.

1. ද්‍රව්‍ය නාම 2. පුද්ගල නාම 3. ස්ථාන නාම 4. සත්ත්ව නාම

ද්‍රව්‍ය නාම යම් දෙයක් හඟවන පද ද්‍රව්‍ය නාම නම් වේ.
උදා : පුටුව , පොත, මේසය

පුද්ගල නාම යම් කෙනෙක් / පුද්ගලයෙක් හඟවන පද පුද්ගල නාම නම් වේ.
උදා : අම්මා, සරත්, වෛද්‍යවරයා

ස්ථාන නාම යම්කිසි තැනක් හඟවන පද ස්ථාන නාම නම් වේ.
උදා : ගඟ, පාසල, අහස

සත්ත්ව නාම යම්කිසි සත්ත්වයෙක් හඳුන්වන පද සත්ත්ව නාම වේ.
උදා : කුඹියා, අලියා, මයිනා

**ඡේද පොතෙහි ක්‍රියාකාරකම 2 පියවර 1**

'අපේ ගෙදර' ඡේදය හොඳින් කියවන්න. ඡේදය කපා පොතේ අලවා ගන්න.

**පියවර 2**

- ඡේදයේ සඳහන් පුද්ගල නාම පද හඳුනා ගෙන යටින් ඉරක් අඳින්න.
- ද්‍රව්‍ය නාම පද වටා කොටුවක් අඳින්න.
- සත්ත්ව නාම පද වටා රවුමක් අඳින්න.
- ස්ථාන නාම පද යටින් √ ලකුණ යොදන්න.

ඔබ හඳුනාගත් නාම පද ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

නාම පද

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| කේතලය | අම්මා | කුස්සිය | කුකුළා |
| ............................ | ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ | ............................ |

- කොටුව තුළ ඇති නාම පද සුදුසු තීරුවේ ලියන්න.

| | | | |
|---|---|---|---|
| මල් පෝච්චිය | වඳුරා | පළගැටියා | ඔරලෝසුව |
| විදුහල්පති | මාලනි | වෛද්‍යවරයා | දුම්රිය පොළ |
| ගෙදර | වෙළඳපොළ | පාලිකාව | ඉත්තෑවා |
| පෙනේරය | ගොළුබෙල්ලා | පාසල | අව්ච්චියා |
| කොට්ටය | හෝමාගම | පොත | සිරිමල් |

**නාම පද**

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

- අභ්‍යාස පොතේ පහත සඳහන් වගුව පිටපත් කර ගෙන සම්පූර්ණ කරන්න.

| නාම පදය | පුද්ගල නාම | ද්‍රව්‍ය නාම | සත්ත්ව නාම | ස්ථාන නාම |
|---|---|---|---|---|
| ගේ කුරුල්ලා | | | √ | |
| ලන්තෑරුම | | | | |
| නයනා | | | | |
| පොත | | | | |
| කූඹියා | | | | |
| මුහුද | | | | |
| ලිපිකරුවා | | | | |
| ඉන්දියාව | | | | |
| පන්තේරුව | | | | |
| නැන්දා | | | | |

- කියවීම් පොතේ 'අකුරු සමඟ සෙල්ලම' හා 'සිහින මැවූ සිත්තරිය' පාඩම් කියවා නාම පද වර්ග 4 ට අදාළ වචන සොයා ලියන්න. උදා : ගුරුතුමිය (පුද්ගල නාම)

  පන්තිය (ස්ථාන නාම)

- ඉහත පාඩම් වලින් සොයා ගත් වචන 10 ක් තෝරා ගෙන එම වචන ඇතුළත් කර වාක්‍ය 10 ක් ලියන්න.

  උදා : <u>ගුරුතුමිය</u> අකුරු උගන්වයි.

  අපි <u>පන්තිය</u> පිරිසිදු කරමු.

## ප්‍රාණවාචී නාම පද සහ අප්‍රාණවාචී නාම පද

- පුද්ගලයන්, සතුන් යන සියලු දෙනාටම පණ ඇති නිසා ඒවා ප්‍රාණවාචී නාම පද ලෙසින් හඳුන්වයි.

  උදා : මාමා, බට්ටිච්චා

- ද්‍රව්‍යවලට පණ නැති නිසා ඒවා අප්‍රාණවාචී නාම පද ලෙසින් හඳුන්වයි.

  උදා : පොත, පැන්සල

**ක්‍රියාකාරකම 1- පියවර 1**

නිමල්ගේ වත්තේ අඹ ගසක් තිබේ..... ඡේදය හොඳින් කියවන්න.

- ඡේදයේ ඇති ප්‍රාණවාචී නාම පද වටා රවුමක් අඳින්න.
- අප්‍රාණවාචී නාම පද සොයා ඒ වටා කොටුවක් අඳින්න.

**ක්‍රියාකාරකම 2 - පියවර 1**

අපි අගෝස්තු නිවාඩුවට යාල වනෝද්‍යානයට ගියෙමු. ඡේදය කියවන්න. වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |

- **පහත සඳහන් කවිය ගායනා කරන්න.**

බට්ටි මලිති - කුරුලු පැටවු
සැම තැන - ඉගිළී
ජම්බු ගසේ - ඉදුණු ජම්බු
සොය සොයා - කතී

ලේන් පැටවු - ටිං ටිං ගා
එහෙ මෙහෙ - දුවතී
පේර ගසේ - ඉදුණු පේර
රස දැයි - බලතී

සමනලයෝ - රැන් රැන්
අත්තටු - සලතී
රෝස ගසේ - මල් පැණි බී
සිරිපා - වඳිතී.

- ගීතය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| නාම පදය | ප්‍රණාවචී | අප්‍රාණවාචී |
|---|---|---|
| කුරුලු පැටවු | | |
| ජම්බු | | |
| ලේන් පැටවු | | |
| පේර | | |
| සමනලයෝ | | |
| මල්පැණි | | |
| රෝස ගසේ | | |

- පහත සඳහන් ප්‍රාණාවචී සහ අප්‍රාණවාචී නාම පද යොදා වාක්‍ය සකස් කර ලියන්න.

කුරුලු පැටවු ජම්බු ගස සමනලයෝ මල් පැණි පේර

## ස්ත්‍රී ලිංග නාම පද හා පුරුෂ ලිංග නාම පද

1, 2, 3 ශ්‍රේණි වලදී ඔබ ඉගෙන ගත් ස්ත්‍රී ලිංග නාම පද හා පුරුෂ ලිංග නාම පද මතකයට නංවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| අම්මා | - තාත්තා | පුතා | ........................... | මුවා | ........................... |
| නංගී | - ....................... | මිතුරා | ........................... | වෛද්‍යවරයා | ........................... |
| ගිරවා | - ........................ | රජ | ........................... | විදුහල්පතිතුමා | ........................... |
| කුරුල්ලා | -...................... | ගුරුතුමා | ....................... | සිංහයා | ........................... |

**ක්‍රියාකාරකම 1- පියවර 2**

අප විදුහලේ 'පිපෙන කැකුළු' විවිධ ප්‍රසංගය ........ ජේදය කියා එහි ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග නාම පද හඳුනා ගන්න. පහත වගුව සම්පූර්ණ කරන්න.

| පුරුෂ ලිංග නාමපද | ස්ත්‍රී ලිංග නාමපද |
|---|---|
| යහළුවා | ....................................... |
| නළුවා | ....................................... |
| ඇතා | ....................................... |
| කොටියා | ....................................... |
| සහෝදරයා | ....................................... |

**ක්‍රියාකාරකම 3 - පියවර 1**

ජේද පොතේ සඳහන් ආදර වදනින් අප සනසයි....... කවි පෙළ තලයට ගායනා කරන්න.

කවි පෙළ ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| පුරුෂ ලිංග නාමපද | ස්ත්‍රී ලිංග නාමපද |
|---|---|
| | |

**<u>ක්‍රියාකාරකම 4 - පියවර 1</u>**

පැවරුම ඡේද පොතෙන් කපා ගන්න. හිස්තැනට සුදුසු පදය කොටුවෙන් තෝරා ලියන්න.

## <u>ඒකවචන හා බහු වචන නාම පද</u>

1, 2, 3 ශ්‍රේණි වලදී ඉගෙන ගත් ඒක වචන, බහු වචන නාම පද මතකයට නංවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ගස | ......................... | කුරුල්ලා | ........................... | පොත | ......................... |
| මල | ......................... | උදැල්ල | ........................... | කුඹුර | .......................... |
| ගල | ......................... | ගොවියා | ........................... | ළමයා | ........................... |
| අම්මා | ......................... | බල්ලා | ........................... | ශිෂ්‍යයා | .......................... |
| තාත්තා | ......................... | ගවයා | ............................ | මම | ........................... |

**<u>ක්‍රියාකාරකම 1 - පියවර 2</u>**

ඉද්දමල්ගොඩ විද්‍යාලයේ සෑම වසරකම ........... ඡේදය කපා අභ්‍යාස පොතේ අලවා ගන්න. හොඳින් කියවන්න.

ඡේදයේ ඇතුළත් ඒක වචන නාම පද හා බහු වචන නාම පද හඳුනා ගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| ඒක වචන පද | බහු වචන පද |
|---|---|
| පේළිය | ..................................... |
| කණ්ඩායම | ..................................... |
| ගුරුවරයා | ..................................... |
| රට | ..................................... |
| ලේඛකයා | ..................................... |

**ක්‍රියාකාරකම 5 - පියවර 1**

නැගෙනහිර අහසේ හිරු පායා ගෙන එන්නේ........ ඡේදය කපා අලවා ගන්න.

පියවර 2

ඡේදය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ඒක වචන පද | බහු වචන පද |
|---|---|
| ගස | ගස් |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |
| ...................................... | ...................................... |

පියවර 3

දී ඇති නාම පදය අයත් වන්නේ ඒක වචන / බහු වචන වර්ගයටදැයි හඳුනා ගෙන හරි ලකුණ ( √ ) යොදන්න.

| නාම පදය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පුටුව | √ | |
| පෑන් | | |
| කරත්තය | | |
| ගුරුවරයා | | |
| පොත් | | |
| වෛද්‍යවරු | | |
| මල | | |
| පෑන | | |
| තාත්තා | | |
| වෛද්‍යවරයා | | |
| පුටු | | |
| පොත | | |
| මල් | | |
| කරත්ත | | |
| තාත්තලා | | |
| ගුරුවරු | | |